# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.07 පැය 0625 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1858/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් - හුංගම පොලිස් වසම.**

2025.10.07 වන අද දින අළුයම් කාලයේ හුංගම පොලිස් වසමේ වාඩිගල, රන්න ප්‍රදේශයේ නිවසක් තුල පුද්ගලයෙකු හා කාන්තාවක් කපා කොටා ඝාතනය කර ඇති බවට හුංගම පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු සහ මරණකාරිය වයස අවුරුදු 28 ක් වූ රන්න ප්‍රදේශයේ සහ තිස්සමහාරාම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මරණකරු තම මිතුරෙකුගේ නිවසේ සිය අනියම් බිරිඳ සමඟ රැඳී සිටියදී මුහුණු ආවරණය කරගත් පස් දෙනෙකුගෙන් පමණ සමන්විත කණ්ඩායමක් නිවසට ඇතුළු වී තියුණු ආයුධ වලින් පහරදී ඝාතනය කර ඇත.

ඝාතනයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෘත ශරීර මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇත. හුංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතන සහ මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම් රැසකට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2025.09.29 වන දින රාත්‍රී කාලයේ තලංගම පොලිස් ස්ථානයේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව තලංගම පොලිස් වසමේ තලවතුගොඩ ප්‍රදේශයේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිබුණි.

සැකකරු සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී, සැකකරු දැනට විදෙස්ගතව සැඟව සිටින සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ සමීප සබඳතා පවත්වන පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත. සැකකරු මෝදර පොලිස් වසමේදී වෙඩි තබා මනුෂ්‍ය ඝාතනය කිරීමකට තැත් කිරීම, මෝදර සහ කොල්ලුපිටිය පොලිස් වසම්වලදී හෙරොයින් සන්තකයේ තබා ගැනීම සහ පුද්ගලයෙකු පැහැර ගැනීමක් සම්බන්ධයෙන් සැකකරුට එරෙහිව නඩු පවරා ඇති බවට අනාවරණය වී ඇත.

ඒ අනුව සැකකරු කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර දින 07 ක් රැඳවුම් නියෝග මත රඳවාගෙන විමර්ශන කටයුතු සිදු කරන ලදී.

**සැකකරු වයස අවුරුදු 36 ක් වන තලවතුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රැඳවුම් නියෝග මත රඳවාගෙන සිදු කළ ප්‍රශ්න කිරීම් වලදී සැකකරු පහත අපරාධ වලට සම්බන්ධ බවට අනාවරණය වී ඇත.

- 2024.12.08 වන දින ගම්පහ පොලිස් වසමේදී පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයේ යතුරු පැදියේ පැදිකරු ලෙස ක්‍රියා කිරීම.
- 2025.03.08 වන දින සහ 2025.04.15 වන දින ගම්පහ පොලිස් වසමේදී වෙඩි තබා මනුෂ්‍ය ඝාතන දෙකකට තැත් කිරීමේ අපරාධවල යතුරු පැදියේ පැදිකරු ලෙස ක්‍රියා කිරීම.
- 2025.03.13 වන දින වැලිවේරිය පොලිස් වසමේදී පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයේ යතුරු පැදියේ පැදිකරු ලෙස ක්‍රියා කිරීම.

සැකකරු විසින් වෙඩි තැබීමේ අපරාධ සඳහා යොදාගත් බවට සැක කරන ව්‍යාජ අංක තහඩු සවිකරන ලද යතුරු පැදියක් ද විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන ඇත.

සැකකරු 2025.10.06 වන දින කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2025.10.21 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.

## 03. විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාගොඩ පොලිස් ස්ථානය.

2025.10.06 වන දින සවස් කාලයේ නාගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව නාගොඩ අළුත්තානායම්ගොඩ ප්‍රදේශයේදී විදෙස් රටක නිෂ්පාදිත පැනක ස්වරූපයේ එක් උණ්ඩයක් පමණක් යෙදිය හැකි අර්ධ ස්වංක්‍රීය ගිනි අවියක්, එයට යොදන පතොරොම් 02 ක් හා භාවිතා කරන ලද පතොරොම් කොපු 05 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වන මාපලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

## 04. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද බීඩි කොළ තොගයක් සහ හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දුන්ගල්පිටිය පොලිස් ස්ථානය.

2025.10.06 වන දින උදෑසන කාලයේ දුන්ගල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව දුන්ගල්පිටිය පොලිස් වසමේ පිටිපන ලෙල්ලම ප්‍රදේශයේදී සැකකටයුතු ලොරි රථයක් පරීක්ෂා කර තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද බීඩි කොළ කිලෝ 2429 ග්‍රෑම් 550 ක් සහ ලොරි රථය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් පරීක්ෂා කිරීමේදී එක් සැකකරුවෙකු සන්තකයේ හෙරොයින් ග්රෑම් 03 මිලිග්‍රෑම් 220 ක් සහ අනෙක් සැකකරු සන්තකයේ හෙරොයින් ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 110 ක් සොයාගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 30 සහ 34 වයස්වල පසු වන මීගමුව සහ පරසන්ගස්වැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දුන්ගල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**